සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

6 ශ්‍රේණිය

# නාට්‍ය හා රංග කලාව

කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 සාත්වික අභිනය යනු,

(i) වචනයෙන් අදහස් ප්‍රකාශ කිරීමයි. (ii) මුහුණින් අදහස් ප්‍රකාශ කිරීමයි.

(iii) අත් පාවලින් අදහස් ප්‍රකාශ කිරීම. (iv) ඇඳුම් පැළඳුම්වලින් අදහස් ප්‍රකාශ කිරීම.

02 නළුවකු සතුවිය යුතු ගුණාංගයකි.

(i) කැපවීම (ii) වෙලාවට වැඩ නොකිරීම

(iii) අන්‍ය මතවලට ගරු නොකිරීම (iv) නොඉවසීම

03 ස්වාභාවික පරිසරයේ අනුකරණය කළ හැකි අවස්ථාවකි.

(i) ගෙවල් තැනීම (ii) මල් පිපීම

(iii) රිය අනතුරක් (iv) මාළු විකිණීම

04 චිත්‍රපටය,

(i) සජීවී මාධ්‍යයකි. (ii) ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයකි.

(iii) ශ්‍රව්‍ය මාධ්‍යයකි. (iv) දෘශ්‍ය මාධ්‍යයකි.

05 රජ බිසවකට සුදුසු ආභරණයක් නොවන්නේ,

(i) මාලය (ii) වළල්ල

(iii) අත් ඔරලෝසුව (iv) අරුංගල්

- නොගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.

06 ආහාර්ය අභිනයට අයත් වේ,

(i) රංගාලෝකය (ii) අංග රචනය

(iii) රංග භූමිය (iv) පසුතල නිර්මාණය

07 ජන ක්‍රීඩාවලින් වර්ධනය කරගත හැක.

(i) සාමූහිකත්වය (ii) ශෝකය

(iii) නිරෝගී බව (iv) ජය පැරදුම සමව විඳගැනීම

08 කතාන්දරයක දැකියහැකි ලක්ෂණ වේ.

(i) සිද්ධි මාලාවක් තිබීම. (ii) රංග විධාන තිබීම.

(iii) අසා රසවිඳිය හැකි වීම. (iv) සංවාද තිබීම.

09 නාට්‍යෝපකරණවලින් ලැබෙන ප්‍රයෝජන වන්නේ,

(i) ප්‍රේක්ෂක රසයට බාධා වීම. (ii) නළු කාර්යයට පහසු වීම.

(iii) රංගය තීව්‍ර වීම. (iv) චරිතය හඳුනාගැනීමට හැකි වීම.

10 නාට්‍යයක් රංගනය සඳහා සූදානම් කිරීමේදී අවශ්‍ය ශිල්පීන් වේ.

(i) නළුවන් (ii) අනුශාංගික ශිල්පීන්

(iii) අධ්‍යක්ෂවරයා (iv) ප්‍රේක්ෂකයන්

- හිස්තැන් පුරවන්න.

11 වෙස් මුහුණු ........................................................................................ අයත් වේ.

12 .................................................................................................... ජන කථාවකි.

13 ..................................................................................... නාට්‍යධර්මී නාට්‍යයකි.

14 .................................................................................................... ජන ක්‍රීඩාවකි.

15 නාට්‍යයක් රංගයක් බවට පත් කිරීමේදී මූලික වන පුද්ගලයා ...................................................................... වේ.

(එළුවන් කෑම, බාහිර සමාරෝපය, වෙල්ල වැහුම්, මනමේ, අධ්‍යක්ෂක)

- ගැලපෙන පිළිතුර තෝරා යා කරන්න.

| | |
|---|---|
| 16 පරිකල්පයන | ගැඹුරු ජීවන අත්දැකීමක් ඇත. |
| 17 ක්ෂණික නිරූපණය | නළුවාට අවශ්‍ය වේ. |
| 18 ලෝක ධර්මී නාට්‍යය | අසා රස විඳිය හැක. |
| 19 කතාන්දරය | පිටපතක් නැත. |
| 20 වේදිකා නාට්‍යය | පවතින ලෝකයට සමාන ය. |

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.

01 I වන මීයා - වෙන නුවනක් ගැන සිතා බලන්නේ (කුකුල්හාමි එළියට එයි.)

මලක් - එච්චර කරදර මොකට ද? කුකුල්හාමි අර ඉන්නේ. ගොහින් කථාකර බලන්න. (කුකුල්හාමි වටපිට බලයි.)

සියල්ලෝම - ආයුබෝවන් කුකුල් හාමි.

කුකුල්හාමි - ආයුබෝවන් පොඩි දරුවනි. ඉතින් මොකද මේ පැත්තේ. ඇයිද කථාවක් නැත්තේ

(i) මෙම සංවාද කණ්ඩය අයත් නාට්‍ය පෙළෙහි නම කුමක් ද? (ල. 02)

(ii) එය රචනා කරන ලද්දේ කවුරුනු විසින් ද? (ල. 02)

(iii) මෙහි එන රංග විධාන දෙකක් ලියන්න. (ල. 02)

(iv) මෙහි එන මී හාමිලාගේ චරිත ලක්‍ෂණ දෙකක් ලියන්න. (ල. 02)

(v) මෙහ එන ප්‍රධාන චරිතය නම්කර එම චරිතයෙන් ඔබට ගතහැකි ආදර්ශයක් ලියන්න. (ල. 02)

02 (i) රංග ආභරණ අයත්වන අභියන නම් කරන්න. (ල. 02)

(ii) රංග ආභරණ නිර්මාණය සඳහා යොදාගත හැකි ස්වාභාවික අමුද්‍රව්‍ය මොනවා ද? (ල. 03)

(iii) ඔබ පාසලේදී නිර්මාණය කළ රංග ආභරණයක් ඇඳ දක්වා එය නිර්මාණය කළ ආකාරය පිළිබඳ පැහැදිලි කරන්න. (ල. 05)

03 (i) අභිනය යනු කුමක් ද? (ල. 02)

(ii) සතර අභිනය නම් කරන්න. (ල. 03)

(iii) ඔබ නැරඹූ ළමා නාට්‍යයක සතර අභිනය යොදාගෙන ඇති ආකාරය ලියන්න. (ල. 05)

04 පන්ති කාමරයේදී ඔබ කණ්ඩායම එකතු වී ඉදිරිපත් කල නාට්‍ය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඔබ කණ්ඩායම නිර්මාණය කළ නාට්‍යයේ නම කුමක් ද? (ල. 02)

(ii) එම නාට්‍ය සඳහා යොදාගත් ආනුෂාංගික අංග මොනවා ද? (ල. 03)

(iii) එම නාට්‍ය නිර්මාණය කිරීම සඳහා ඔබ කණ්ඩායමක් ලෙස ක්‍රියාකළ ආකාරය කෙටියෙන් ලියන්න. (ල. 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( ii ) 02. ( i ) 03. ( ii ) 04. ( ii ) 05. (iii) 06. (iii) 07. ( ii ) 08. (iii) 09. ( i ) 10. (iv)

11. බාහිර සමාරෝපය 12 වෙල්ලවැහුම් 13 මනමේ 14 එළුවන් කැම 15 අධ්‍යක්ෂක

16 නළුවාට අවශ්‍ය වේ 17 පිටපතක් නැත 18 පවතින ලෝකයට සමානය 19 අසා රස විඳිය හැක

20 ගැඹුරු ජීවන අත්දැකීමක් ඇත.

## II කොටස

01 (i) පුංචි අපට දැන් තේරෙයි. (ල. 02)

(ii) සෝමලතා සුබසිංහ මහත්මිය. (ල. 02)

(iii) (කුකුල්හාමි එළියට එයි.) (කුකුල්හාමි වටපිට බලයි.) (ල. 02)

(iv) අලසකම, විනෝදයට බර වීම. (ල. 02)

(v) කුකුල් හාමි - අනුන්ට උදව් කිරීම, මහන්සි වී වැඩ කිරීම, කරුණාවන්ත වීම. (ල. 02) (මුළු ලකුණු 10)

02 (i) ආහාර්ය අභිනය (ල. 02)

(ii) කිරිඳි, ඔළිඳ, රබර්, සියඹලා, පුස්, මදටිය වැනි ඇට වර්ග, මඤ්ඤොක්කා බඩ (ල. 03)

(iii) නිවැරදි පිළිතුර ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 05)

03 (i) නාට්‍යයක් ප්‍රේක්ෂකයන් වෙත ඉදිරිපත් කරන මාධ්‍යය අභිනය වේ. (ල. 02)

(ii) වාචික අභිනය, ආංගික අභිනය, සාත්වික අභිනය, ආහාර්ය අභිනය (ල. 03)

(iii) නිවැරදි පිළිතුර ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 03)

04 (i) ලියා ඇති පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ල. 02)

(ii) රංග වස්ත්‍රාභරණ, අංග රචනය, පසුතල නිර්මාණ, රංගාලෝකය, සංගීතය ආදිය (ල. 03)

(iii) නිවැරදි පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 05)

05 (i) නළුවාගේ කායික මානසික සමබරතාවය ඇතිකර ගැනීම සඳහා කරනු ලබන අභ්‍යාස රංග අභ්‍යාස වේ.

(ii) රංග අභයාස - ශිථිලකරණ අභ්‍යාස, සංවේදන අභ්‍යාස, තාපන අභ්‍යාස, ශ්වසන අභ්‍යාස, කටහඬ අභ්‍යාස

රංග ක්‍රීඩා - මීයෝ පූසෝ, මැණික සොරා ගැනීම, අංකවලට එකතු වීම, රාක්ෂයෙක් පැමිණීම, මකර වලිගය